**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2015**

**-----------------------------------------------------------------**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනතේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1. 2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1:3. විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මං විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලවන පරිදි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත ව්‍යාපෘති ප්‍රදාන යටතේ ලැබී තිබුණු රු.1,394,400 ක් වටිනා ගිණුම්කරණ පැකේජය අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වනවා වෙනුවට පරිගණක හා යන්ත්‍රෝපකරණ ලෙස දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රතිඵලය සෑම වර්ෂයක් අවසානයේම සමුච්චිත අරමුදලට මාරු කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය ආරම්භයේ නැවතත් රු.7,405,666 ක ලාභ අලාභ බැර ශේෂයක් පෙන්නුම් කර තිබුණි. මෙයට අතිරේකව උසස් තාක්ෂණ ආයතන නමින් පැවති සමුච්චිත අරමුදල් ශේෂයන්වල එකතුව ලෙජර් ගිණුම් අනුව රු.110,895,717ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට එය ඇතුළත් කිරීමේදී රු.103,534,334 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලායෑම් තුළ ඉකුත් වර්ෂයේ මිලදී ගැනීම් සඳහා ගෙවූ රු.593,015 ක් ඇතුළත් කර තිබුණි.

**2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්**

සමාලෝචිත වර්ෂය අවසානයේ වූ රාජ්‍ය ප්‍රදාන ශේෂයට රු.44,285 ක ගැළපීමක් සිදුකර තිබූ නමුත් එම ගැළපීමට හේතු පැහැදිලි කර නොතිබුණි.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2000 සිට 2012 වර්ෂය දක්වා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇති නිළධාරින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,641,988 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

**2.4 නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | නියැදි පරීක්ෂණයට අනුව දෙහිවල, අනුරාධපුර සහ මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතන විසින් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | 2013 අගෝස්තු 02 දිනැති අංක 01/2013 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (ඌ) (i) ඡේදය හා 2015 අගෝස්තු 26 දිනැති අංක TIP/01/permit (xvii) දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ ලිපිය | අදාල නියමයන්ට අනුකූල නොවන පරිදි සුභසාධන හා ස්ථාපන නිලධාරීන් තුන් දෙනෙකු වෙත සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කර තිබුණි. |
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අංක 08, 3.4.2 (ආ) වගන්තිය | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අනුරාධපුර උසස් තාක්ෂණ ආයතනික අංශය වෙත රු. 1,154,400 ක ජලපෙරණයක් මිලදීගෙන තිබුණු අතර 2016 ජුනි දක්වා එය ස්ථාපිත කර නොතිබුණි. |
| (ඈ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2013 නොවැම්බර් 15 දිනැති අංක SLIATE/01/2013/EXAM දරන අභ්‍යන්තර චක්‍රලේඛය පාදක කරගනිමින් 2013 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි විභාග රාජකාරි සඳහා ගෙවීම් සිදුකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,516,167 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.54,087,414 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 37,571,247 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 139,530,767 කින් වැඩිවී තිබුණද පුද්ගල පඩිනඩි, ගිවිසුම්ගත සේවා පුහුණු හා ඇගයීම් වියදම් සහ ක්ෂයවීම් රු.176,212,355 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට විශේෂයෙන් බලපා තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු දායකත්වයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දායකත්වය රු. 874,964,704 ක් වූ අතර 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වය ඉහළ යාම සියයට 14ක් විය.

### 3.2 විග්‍රහාත්මක සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 8:1ක් වූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එම අනුපාතය සියයට 167කින් වර්ධනය වී තිබුණි. ජංගම ගිණුම් තුළ මුදල් රඳවා ගැනීම හා කෙටිකාලීන ආයෝජන වැඩිකිරීම මෙම වර්ධනයට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි අරමුණු වනුයේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම, සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම විධිමත් කිරීම සහ උසස් තාක්ෂණ ආයතන වල ශාස්ත්‍රීය හා පුහුණු කිරීමේ ප්‍රමිති පවත්වා ගැනීම වන අතර සමාලෝචිත වර්ෂය අවසානයට උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා 14ක් සහිතව දිවයින පුරා උසස් තාක්ෂණ ආයතන 11ක් හා උසස් තාක්ෂණ ආයතනික අංශ 06ක් යටතේ සිසුන් 17,605ක් අධ්‍යාපනය හදාරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන එක් එක් පාඨමාලාව අනුව වර්ෂ 5ක ශිෂ්‍ය ලියාපදිංචිය පරීක්ෂාවේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ක්‍රමික වර්ධනයක් සිදුවී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2015 වර්ෂයේ පළමු සාමාසිකයෙහි විභාග ප්‍රතිඵල අනුව සිසුන්ගේ සමත් වීමේ ප්‍රතිශතය සියයට 64 සිට සියයට 90 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි උසස් තාක්ෂණ ආයතන හා ආයතනික අංශයන්හි පවත්වා ගෙනගිය පහත සඳහන් පාඨමාලා 2015 වර්ෂයේදී ක්‍රියාත්මක වී නොතිබුණි.

(i) තංගල්ල, කෑගල්ල, අම්පාර, ගාල්ල, ගම්පහ සහ රත්නපුර යන උසස් තාක්ෂණ ආයතනයන්හි උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධකාලීන) පාඨමාලාව
(ii) ගාල්ල හා මහනුවර උසස් තාක්ෂණ ආයතනයන්හි උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා (අර්ධකාලීන) පාඨමාලාව
(iii) ගම්පහ උසස් තාක්ෂණ ආයතනයෙහි උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (අර්ධකාලීන) පාඨමාලාව

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අම්පාර උසස් තාක්ෂණ ආයතනය සතුව නිල නිවාස 50ක් පවතින අතර ඉන් 27ක උසස් තාක්ෂණ ආයතනයේ නිලධාරීන්, වෙනත් රාජ්‍ය නිලධාරීන් හා බාහිර පාර්ශව පදිංචි වී සිටින අතර එම නිවාස වලින් නිවාස 19ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. අබලන්වූ නිවාස අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කිරීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ලබුදූව, බදුල්ල, අම්පාර, යාපනය, අනුරාධපුරය, මඩකලපුව, සමන්තුරේ, තංගල්ල, නයිවල, වව්නියාව, කුරුණෑගල, රත්නපුරය සහ මහනුවර උසස් තාක්ෂණ ආයතනය සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් 2015 දෙසැම්බර් 31 දින වන විටද අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි වාහන රක්ෂණය කරනු ලබන රක්ෂණ සමාගම විසින් ඒ ඒ වර්ෂයන්හි වාහනවල වෙළඳපොළ වටිනාකම මත රක්ෂණ වටිනාකම සංශෝධනය කර ගැනීමට දැනුවත් කර තිබියදී ආයතනය විසින් මූලික රක්ෂණ වටිනාකමම පදනම් කර ගෙන අධිරක්ෂණ වාරික ගෙවීම් කර තිබුණි.

(ඈ) අම්පාර උසස් තාක්ෂණ ආයතනය පිහිටි භූමියේ කාර්මික විද්‍යාලයද පිහිටා ඇති බැවින් ආයතන දෙක සඳහාම එකම විදුලි මීටරයක් භාවිතා කරනු ලබන අතර මෙම ආයතනය විසින් භාවිතා කරනු ලබන ඒකක සැසඳීමකින් තොරව දිගින් දිගටම විදුලි බිලෙන් සියයට 65 ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.2,246,216 ක විදුලි ගාස්තු ගෙවා තිබුණු අතර ආයතන 02 වෙනුවෙන් වෙන වෙනම විදුලි මීටර් සවිකරගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 අප්‍රේල් 18 දින අනතුරට පත්වූ KI 0645 දරන වාහනය සඳහා පූර්ණ හානියක් ලෙස රු.3,100,000ක් හෝ අලුත්වැඩියා සඳහා රු.1,300,000ක් ලබා දීමට රක්ෂණ සමාගම විසින් එකඟ වී තිබුණි. රක්ෂණ සමාගමෙන් රු.3,100,000ක් ලබාගෙන වාහනය ඉවත් කිරීමට ආයතනය විසින් තීරණය කර තිබුණද 2016 ජුනි මාසය දක්වා අදාල කටයුතු සමතයකට පත්කර ගැනීමට හා වන්දි ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 4.3 අරමුදල් උපයෝජනය

-----------------------

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 445 ක ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබූ නමුත් එයින් රු. මිලියන 204 ක් හෙවත් සියයට 46 ක් පමණක් උපයෝජනය කර නොතිබුණි. මෙසේ ඉතිරි වූ ප්‍රදාන හා ආයතනික ආදායම් ලෙස ලැබූ ආදායමින් රු.341,522,161 ක් ඵලදායී කාර්යයක නොයොදා සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම හා ඉතුරුම් ගිණුම් වල රඳවා ගෙන තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂණය අනුව උසස් තාක්ෂණ ආයතන 03ක් වෙත ලබා දී තිබුණු රු.9,994,548 ක් වටිනා වත්කම් ඌන උපයෝජිතව ගබඩා කර තිබුණි.

(ආ) දෙහිවල උසස් තාක්ෂණ ආයතනය සඳහා 2014 මාර්තු 05 දින රු.827,556 කට මිලදීගත් පරිගණක පුටු 55 ක් නියමිත ප්‍රමිතියට නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පාවිච්චියට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

(ඇ) මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනය වෙත උසස් තාක්ෂණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතියෙන් 2011 පෙබරවාරි 23 දින ලද යූරෝ 648.11 ක් වටිනා කලර් ලේසර් ප්‍රින්ටරයක්, ඡායා පිටපත් යන්ත්‍ර 02ක් සහ කලර් ස්කෑනින් යන්ත්‍ර 02ක් අලුත්වැඩියා කිරීමකින් තොරව ඌන උපයෝජිතව ගබඩාවේ පැවතුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

---------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය ප්‍රකාරව සහ මූල්‍ය ප්‍රකාශන වලට සමගාමීව අයවැය ලේඛන පිළියෙල කර නොතිබුණු අතර අයවැය ගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 133 සිට සියයට 859 දක්වා වු පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) අත්තිකාරම් හා සුළු මුදල් පාලනය | - මු. රෙ. 371(2) හි සඳහන් සීමාව ඉක්මවා අතුරු අග්‍රිම ලබාදීම.<br>- එකම නිලධාරියකු වෙත කලින් ලබාගත් අත්තිකාරම් පියවා නොතිබියදී නැවත අත්තිකාරම් ලබාදීම.<br>- සුළු මුදල් ප්‍රතිපූර්ණය විධිමත් නොවීම. |
| (ආ) වාහන පාලනය | - වාහන ලේඛනය හා ලොග් සටහන් පොත් විධිමත් ලෙස සම්පූර්ණ කර නොතිබීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | - පුස්තකාල පොත් නියමිත කාලයට නැවත භාරනොදීම හා පරිග්‍රහන ලේඛන සම්පූර්ණ කර නොතිබීම.<br>- ආරක්ෂක සේවා සහ පවිත්‍රතා ගිවිසුම් විධිමත් අයුරින් සිදු නොවීම.<br>- දේශකවරුන් විසින් ආවරණය කල යුතු පැය ගණන හා ආවරණය කරන පැය ගණන අතර විචලතා පැවතීම.<br>- ශිෂ්‍ය පැමිණීම හා දේශන පැවැත්වීමට අදාළ ලේඛන නිසි පරිදි අනුමත කොට යාවත්කාලීන නොකිරීම. |
| (ඇ) ගිණුම්කරණ පද්ධති | - ගිණුම්කරණ පැකේජයේ පහසුකම් මෙහෙයුම් කටයුතු කිහිපයකටම භාවිතා කර ගත හැකි නමුත් එම ප්‍රයෝජන ලබා නොගැනීම.<br>- නිසි අධිකාරියකින් තොරව ප්‍රවේශවීම් වැළැක්වීම සඳහා ආරක්ෂිත ක්‍රම යොදා නොතිබීම. |

- පොදු ලෙජරය තුළ උසස් තාක්ෂණ අංශයන්ට අදාළ ආදායම් වියදම් වෙනම ගිණුම්ගත නොවීම.

- එකම අංකයකින් වවුචර්පත් කිහිපයක් නිකුත් කිරීම හා වවුචර් පිළියෙල කරන හා පරීක්ෂා කරන නිලධාරීන් අත්සන් නොකිරීම.

- ජර්නල් සටහන් සඳහා අනුක්‍රමික කරන ලද ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබූ අතර ඒ සඳහා අවශ්‍ය ආධාරක ලියවිලිද ඇතුළත් වී නොතිබීම.

(ඉ) ගබඩා පාලනය

- බඩු වට්ටෝරු පොත් ශේෂකර නොතිබීම සහ වගකීම් කාලය ඉක්මවූ භාණ්ඩද භාවිතයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබීම.

- පරිගණක විද්‍යාගාර සතු අයිතමයන් තොග ලේඛනයේ නිවැරදිව ඇතුළත් කර නොතිබීම.

(ඊ) අභ්‍යන්තර පාලනය

- පාඨමාලා ගාස්තු සහ ආදායම් පාලනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් වැඩ බෙදීමක් නොමැතිවීම.